# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/22 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ කරන ලද නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මම, මුදල් හා ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යවරයාද විමසා මේ නියමය මගින් :

(1) ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති හම්බන්තොට වරායේ නිදහස් වරාය (Free Port) තුළ පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර, පිරිපහදු නොකරන ලද සීනි ආනයනය කර ඒවා එම පිරිපහදු මධ්‍යස්ථානය තුළ ප්‍රසාදනය කර එම නිෂ්පාදන මෙරට වෙළඳපල තුළ අලෙවිකිරීම සහ අපනයනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියට අදාළ තොරතුරු සඳහන් නිවේදනය වර්ෂ 2013ක් වූ අප්‍රේල් මස 02 දින අංක 1804/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද බවත්

(2) හම්බන්තොට වරායේ නිදහස් වරාය (Free Port) තුළ පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර පිරිපහදු නොකරන ලද සීනි ආනයනය කර ඒවා එම පිරිපහදු මධ්‍යස්ථානය තුළ ප්‍රසාදනය කර එම නිෂ්පාදන මෙරට වෙළඳපල තුළ අලෙවිකිරීම සහ අපනයනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියට පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත්

(3) ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය "හම්බන්තොට වරායේ නිදහස් වරාය (Free Port) තුළ පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර, පිරිපහදු නොකරන ලද සීනි ආනයනය කර ඒවා එම පිරිපහදු මධ්‍යස්ථානය තුළ ප්‍රසාදනය කර එම නිෂ්පාදන මෙරට වෙළඳපල තුළ අලෙවිකිරීම සහ අපනයනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය'' ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර ලංකා සුගර් රිෆයිනරි කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපෘති සමාගම වන බවත්

(4) හම්බන්තොට වරායේ නිදහස් වරාය (Free Port) තුළ පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර පිරිපහදු නොකරන ලද සීනි ආනයනය කර ඒවා එම පිරිපහදු මධ්‍යස්ථානය තුළ ප්‍රසාදනය කර එම නිෂ්පාදන මෙරට වෙළඳපල තුළ අලෙවිකිරීම සහ අපනයනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු 2013 ක්වූ පෙබරවාරි මස 07 වන දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුමේ දිනයේ සිට අවුරුදු 7ක් ඇතුලත වාණිජමය කටයුතු ඇරඹිය යුතු බවත්

1A - PG 1794 — 550 (2013/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(5) තවද,

(i) මෙම ව්‍යාපෘතිය යටතේ පිරිපහදු කළ සීනි තොග දේශීය වෙළඳපලට නිකුත් කරනු ලබන්නේ නම්, සීනි ආනයනය සම්බන්ධයෙන් බලාත්මකව පවතින බදු එම සීනි තොග සඳහා අදාළ වන අතර ;

(ii) පිරිපහදු නොකළ සීනි ආනයනය, පිරිපහදු කළ සීනි අපනයනය සහ එම සීනි තොග දේශීය වෙළඳපලට නිකුත් කිරීම ආදී මෙම ව්‍යාපෘතියේ ව්‍යාපාරික කටයුතු අධීක්ෂණය කිරීම පිණිස අදාළ බලධාරීන් විමසමින් නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනු ලැබේ.

(6) මෙම නියමය උපලේඛනයේ සඳහන් නිදහස් කිරීම්, එහි සඳහන් සීමාකිරීම්වලට යටත්ව ව්‍යාපෘති සමාගමට අදාළ විය යුතු අතර එහි සඳහන් කාල සීමාව තුළ බලාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරමි.

**උපලේඛනය**

1. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ ප්‍රතිපාදන අනුව

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත :

* සමාගම බදු ගෙවිය යුතු ලාභය උපයන මුල් වසරේ ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙක (02) කට පසු කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර දහය (10)කට ආදායම් බදු පනත යටතේ සංස්ථාපිත ආදායම් බදු නිදහස් කාල පරිච්ඡේදයක් ඉන්මතු පැහැදිලි කිරීමක් වශයෙන් ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර දහය (10) ඉකුත් වීමෙන් පසුව එවකට බලපවතින සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාළ වනු ඇත ;
* ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය සඳහා ගෙවන පොලිය සහ ව්‍යාපෘතිය මගින් සේවයේ යොදවනු ලබන උපදේශකයින්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගම නිදහස් කරනු ලැබේ ;
* එකී වසර දහය (10)ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01) කට ලාභවලින් කොටස්කරුවන්හට බෙදා දෙනු ලබන ලාභාංශවලට ආදායම් බදු නිදහස ලැබේ ;
* සේවකයින් 20 දෙනකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයින් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට වසර 5ක කාලයක් සඳහා වලංගු වනු ඇත. මෙම බදු නිදහස වාණිජමය කටයුතු ඇරඹී දිනයේ සිට වසර 5කට පසු අවසන් වන බැවින් එකී කාලයට පසුව ව්‍යාපෘති සමාගම ප්‍රවාසික සේවකයින් දේශීය සේවකයින් මගින් ක්‍රමාත්මකව ප්‍රතිස්ථාපනය කිරීමට උපරිම උත්සාහ ගත යුතුය.

(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත :

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය වන අවුරුදු 7ක කාලය තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන සහ ඉදිකිරීම් භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සඳහා සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ.

(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් පනත :

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය වන අවුරුදු 7ක කාලය තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන සහ ඉදිකිරීම් භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සඳහා වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් මත බදු ගෙවීමෙන් නිදහස් වේ.

(ඈ) 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීම් අයකිරීමේ පනත :

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය වන අවුරුදු 7ක කාලය තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන සහ ඉදිකිරීම් භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සඳහා ජාතිය ගොඩනැගීමේ අයකිරීම් මත බදු ගෙවීමෙන් නිදහස් වේ.

(ඉ) (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත :

- සෘණ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැර ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන්වලට අනන්‍ය වශයෙන් ආනයනය කරනු ලබන අයිතම් සම්බන්ධයෙන් ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම මගින් ආනයනය කරන සියලු ප්‍රාග්ධන භාණ්ඩ

සහ ගොඩනැගීමේ කටයුතුවලට අදාළ භාණ්ඩ ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය තුළ රේගු බදු අයකිරීම් වලින් නිදහස් කිරීම් අදාළ වේ. කෙසේ වෙතත් දේශීය වෙළඳපොලේ එවැනි භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයට සහ ප්‍රමිතියන් නොලැබෙන විට සෘණ ලැයිස්තුවේ සඳහන් අයිතම් ආනයනය කිරීම සැලකිල්ලට ගනු ලැබේ.

- ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිකිරීම් කාලය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දේශීය වශයෙන් මිලදී ගැනීම් සහ ආනයනය කිරීම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සතොස්ක්ෂණයට සහ අනුමැතියට යටත්ව රේගු බදු අයකිරීම් වලින් නිදහස් කිරීම අදාළ වේ. මෙම නිදහස් කිරීම් ව්‍යාපෘතියේ පුද්ගලයෙකු හෝ පුද්ගලික දේපල සම්බන්ධයෙන් ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ නොවේ.

2. 2012 අංක 12 දරන මුදල් පනත

2012 අංක 12 දරන මුදල් පනතේ සංශෝධිත 2013 අංක 12 පනත අනුව (4 වන කොටස වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග) 18(A) 18(C) ප්‍රතිපාදන අනුව :

(අ) විනිමය පාලන පනත සහ රෙගුලාසි

විනිමය පාලන පනතේ I, IA, II, III, IV, V සහ VI දරන ප්‍රතිපාදන ව්‍යාපෘති සමාගමට අදාළ නොවේ.

(ආ) 1969 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතියේ ඉදිකිරීම්වලට අදාළ සියලුම ප්‍රාග්ධන හා ඉදිකිරීම් භාණ්ඩ ආනයනය කිරීම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතියට යටත්ව රේගු බදු අයකිරීම්වලින් නිදහස් වන අතර සංශෝධිත 1969 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ ආනයන සීමාකිරීම් වලින් ද ව්‍යාපෘති ඉදිකිරීම් කාලය තුළ නිදහස් වේ.

(ඇ) ව්‍යාපෘතියට අදාළ අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ආනයනය කරන අවස්ථාවේ දී ව්‍යාපෘති සමාගමට අදාළ නොවේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන (පා.ම.),
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013ක් වූ ඔක්තෝබර් මස 15 දින,
කොළඹ දී ය.

11 - 104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.